**උතුරු මැද පළාත් සභාව - 2021 වර්ෂය**

----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උතුරු මැද පළාත් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2022 නොවැම්බර් 11 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 13 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල 1409 වැය විෂයයට අදාළව ගෙවිය යුතු වියදම් දක්වා නැති නමුත් උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල එකී වැය විෂයයට අදාළව රු.96,957 ක ගෙවිය යුතු වියදම් දක්වා තිබුණි. | පිළිගන්නා බවත් 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කරන බවත් දක්වා ඇත. | උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් පිළියෙල කරන මූල්‍ය ප්‍රකශනවල තොරතුරු සහ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකශනවල තොරතුරු සමාන විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් සහා මූල්‍ය ප්‍රකාශනවල සටහන 13 ප්‍රකාරව ක්ෂය සංචිත අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු.30,884,283 ක් වුවත් 2020 වර්ෂයේදී පළාත් සභා දෙපාර්තමේන්තු 02 ක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් 02 කට අදාළව ක්ෂය සංචිත අරමුදලට ප්‍රේෂණය කර තිබුණු රු.6,979,917 ක් භාණ්ඩාගාරය විසින් ක්ෂය සංචිත අරමුදලට බැර කර නොතිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය සංචිත අරමුදලේ ශේෂය එකී ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බවත් 2022 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කරන බවත් දක්වා ඇත. | අදාළ දෙපාර්තමේන්තු විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් වලට අදාළව ක්ෂය සංචිත අරමුදලට ප්‍රේෂණය කරන මුදල් භාණ්ඩාගාරය විසින් ක්ෂය සංචිත අරමුදලට බැර කළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 01 ප්‍රකාරව පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 04 කට අදාළව උතුරුමැද පළාත් භාණ්ඩාගාරයට පියවා නොතිබුණු රු.27,860,867 ක අග්‍රිම ශේෂයන් වර්ෂ 04 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. එම ශේෂයන්ගෙන් සියයට 95 ක් වූ වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන රු.26,405,861 ක ශේෂයක් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවිය යුතුව තිබුණි. | පිළිගෙන ඇත | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ඉතිරිවූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය 602 - උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන ආදායම් සංකේතාංක 2003.02.13 යටතේ වූ විභාග ගාස්තු ආදායම රු.1,000,000 කට ඇස්තමේන්තු කර තිබුණු නමුත් තථ්‍ය ආදායම රු.4,495,610 ක් වී තිබුණි. ඒ අනුව ඌන ඇස්තමේන්තු වටිනාකම රු.3,495,610 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 350 ක් විය. | ඇස්තමේන්තු අනුමත කිරීමෙන් පසුව ගුරුවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවීම නිසා මෙම වෙනස සිදුවී ඇති බව දක්වා ඇත. | හැකිතාක් තාත්වික සහ නිවැරදි ලෙස තම ඇස්තමේන්තු පිළියෙල කිරීමට ආදායම් ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළයුතු අතර ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම ද කළ හැකිවීම. |

### 1.5.2 ශීර්ෂය 610 - උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විකල්ප බලශක්ති වැඩ සටහන යටතේ 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී උතුරු මැද පළාතේ තෝරාගත් පොදු ස්ථානවල සහ සංචාරක ආකාර්ශනීය ස්ථානවල එකතු වටිනාකම රු.41,787,553 ක් වූ සූර්ය වීථි ලාම්පු 646 ක් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සවි කර තිබුණි. ප්‍රධාන අමාත්‍යාංශය විසින් මෙම සූර්ය වීථි ලාම්පු 646 පළාත් පාලන ආයතන වෙත බාර දී තිබුණු නමුත් පළාත් පාලන ආයතන විසින් ඒවා නිසි පරිදි නඩත්තු කරන බව, | ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඉදිකළ මෙම වීථි ලාම්පු නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත බාරදී තිබුණු නමුත් එම ආයතන විසින් එකී කාර්යය නිසි පරිදි සිදුකර නොතිබීම මෙම තත්ත්වයට හේතුව බව දක්වා ඇත | පළාත් පාලන ආයතන සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව වෙත බාරදී තිබුණු මෙම වීථි ලාම්පු නඩත්තු කිරීම නිසි පරිදි සිදුවන බව තහවුරු කරගැනීමට ප්‍රධාන අමාත්‍යාංශය විසින් අධීක්ෂණයක් පවත්වාගෙන යා යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | නියමිත ප්‍රමිතියෙන් යුතුව ක්‍රියත්මක වන බව, ඒවායේ භෞතික පැවැත්ම සහ ආරක්ෂාව පිළිබඳව පසුවිපරම් සිදු කරන බව නිරීක්ෂණය නොවුණි. මේ හේතුවෙන් වීථි ලාම්පු සවිකර නොතිබීම, සවිකිරිමෙන් පසුව ගලවා ඉවත් කිරීම, අක්‍රිය වීම, සොරුන් විසින් ගැලවීම්, වන සතුන් විසින් හානි කිරීම සහ වාහන අනතුරුවලින් හානි වීම යනා දී හේතුන් නිසා සූර්ය වීථි ලාම්පු 128 ක් භාවිතයේ නොතිබුණු අතර ඒ සඳහා දරන ලද රු.9,124,097 ක වියදම නිෂ්කාර්ය වී තිබුණි. | | |
| (ආ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති ප්‍රතිපාදන මත සිදුකළ ඉදිකිරීම් වෙනුවෙන් මැනුම්පත්, වැඩ අවසාන වාර්තාව හා බිල්පත් ගෙවීම් සාරාංශය ඇතුළු ලියකියවිලිවල මුල් පිටපත් මත එක් අවස්ථාවකදී සහ එකී ලියකියවිලිවල ඡායා පිටපත් මත තවත් අවස්ථාවකදී වශයෙන් උතුරු මැද ප්‍රධාන අමාත්‍යාංශය විසින් ද්විත්ව ගෙවීම් සිදුකර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයේදි අනාවරණය කරගත් පරිදි 2020 පෙබරවාරි 26 දින වනවිට ද්විත්ව ගෙවීම් මගින් වංචනිකව ලබාගෙන තිබුණු මුදල රු.8,608,290 ක් විය.මෙම සම්පූර්ණ මුදලම අයකර ගැනීම සහ ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග අවසන්කර නොතිබුණි. | පිළිගෙන ඇත. | සම්පූර්ණ මුදලම අයකර ගැනීම සහ ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම සිදුකළ යුතු වේ. |
| (ඇ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මකකර තිබුණු ගිවිසුම්ගත මුදල රු.21,946,785 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් රු.9,066,775 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් උතුරු මැද ප්‍රධාන අමාත්‍යාංශය 2016 වර්ෂයේ දී ගෙවා ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණි. එසේ වුවත් එකී අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | පිළිගෙන ඇත. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩ සටහනක් සකස් කිරීම, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් පෞද්ගලික සැපයුම්කරුවෙකු සමඟ රු.15,797,500 ක මුදලකට 2016 මාර්තු 23 දින ගිවිසුම් ගතවී තිබුණි. ගිවිසුම්ගත මුදලින් රු.12,144,500 ක් 2016 දෙසැම්බර් 26 දින වන විට ගෙවා තිබුණු නමුත් 2021 මැයි 10 දින වන විටද සැපයුම්කරු විසින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා යොදා ගැනීමට හැකිවන ලෙස පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. | පිළිගෙන ඇත. | වීඩියෝ වැඩ සටහන, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොත සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවිය සැපයුම්කරු විසින් සැපයීමට පෙර ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළයුතු වේ. |
| (ඉ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ අ/පදවිය මහසෙන් මහා විද්‍යාලයේ තෙමහල් පන්ති කාමර ගොඩනැඟිල්ල, ආපන ශාලාව සහ දෙමහල් විදුහල්පති නිල නිවාසය ඉදිකිරීමේ ව්‍යාපෘති 03 ක් පිළිවෙලින් රු.28,822,475 ක, රු.11,607,260 ක සහ රු.6,637,937 ක වටිනාකම්වලින් යුතුව කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනැමීම නිවේදනය කර තිබුණු අතර ප්‍රතිග්‍රහණ ලිපිය (Letter of Acceptance) අනුව 2016 අගෝස්තු 29 දින ඉදකිරීම් ආරම්භ කළයුතු වුවත් දින 37 ක් ඉකුත් වී ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2016 ඔක්තෝම්බර් 04 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව එකී ගොඩනැගිලිවල ඉදිකිරීම් 2017 අප්‍රේල් 04 දිනට පෙර අවසන් කළයුතුව තිබුණු අතර කාලය දීර්ඝ කිරීමක්ද ලබා දී නොතිබුණි. එසේ වුවත් ගිවිසුම් කාලය අවසන් වී මාස 03 සිට වර්ෂ 02 දක්වා කාලයක් තුළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු එකතුව රු.17,034,747 ක් වූ | පිළිගෙන ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සහ මෙම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | බිල්පත් 03 ක් සඳහා ගෙවීමේදී කොන්ත්‍රාත් ගිවිසුම අනුව අයකළ යුතු රු.4,706,767 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. එසේම විගණන දිනය වූ 2022 අප්‍රේල් 04 දින වන විට ඉදිකිරීම් අවසන් කළයුතු දිනය වර්ෂ 05 කින් ඉකුත් වී තිබුණි. ඒ අනුව මේ දක්වා ගෙවා තිබුණු එකතුව රු. 19,383,974 ක වියදම නිෂ්කාර්ය වී තිබුණු අතර මෙම ගොඩනැඟිලි 03 නඩත්තු කිරීමකින් තොරව ස්වභාවික ආපදාවලට ලක් වෙමින් පැවතුණි. | | |
| (ඊ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ අ/පදවිය පරාක්‍රමපුර ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය 2017 පෙබරවාරි 04 දිනට පෙර ඉදිකිරීම් අවසන් කිරීම සඳහා රු.9,280,680 ක වටිනාකමකට 2016 ඔක්තෝබර් 12 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා ගිවිසුම් ගතව තිබුණි. එසේ වුවත් විගණන දිනය වූ 2022 අප්‍රේල් 04 දින වන විට වර්ෂ 05 ක කාලයක් ඉකුත් වී තිබුණු එකී ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කර බාර දී නොතිබුණි. එහෙත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගේ ඇප බැඳුම්කර, මුදල් කර ගැනීමට හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට ක්‍රියාකර නොතිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු රු.1,841,335 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | පිළිගෙන ඇත. | වැඩ අවසන් කර බාර දී නොතිබුණු කොන්ත්‍රාත්කරුට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම, කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සහ මෙම ව්‍යාපෘතිවල වැඩ අවසන් කීරීම කළයුතු වේ. |
| (උ) | අ/පදවිය මහසෙන් ප්‍රාථමික විද්‍යාලයේ බහුකාර්ය ගොඩනැඟිල්ල ඉදිකිරීම 2016 ඔක්තෝබර් 06 දින සිට 2017 පෙබරවාරි 05 දින දක්වා මාස 04 ක කාලය තුළ අවසන් කළයුතු අතර කාලය දීර්ඝ කිරීමක්ද ලබා දී නොතිබුණි. එසේ වුවත් ගිවිසුම්ගත කාලය අවසන් වී මාස 03 සිට වර්ෂ 02 දක්වා කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු එකතුව රු.4,773,047 ක් වූ බිල්පත් 02 ක් සඳහා ගෙවීමේ දී කොන්ත්‍රාත් ගිවිසුම අනුව අයකළ යුතු රු.933,237 ක් වූ | පිළිගෙන ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම අනුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සහ මෙම ව්‍යාපෘතිවල වැඩ අවසන් කීරීම කළයුතු වේ. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. එසේම විගණන දිනය වූ 2022 අප්‍රේල් 04 දින වන විට ඉදිකිරීම් අවසන් කළයුතු දිනය වර්ෂ 05 කට අධික කාලයකින් ඉකුත් වී තිබුණු නමුත් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි. ඒ අනුව මේ දක්වා ගෙවා තිබුණු එකතුව රු. 5,942,219 ක වියදම නිෂ්කාර්ය වී තිබුණු අතර මෙම ගොඩනැඟිලි නඩත්තු කිරීමකින් තොරව ස්වභාවික ආපදාවලට ලක් වෙමින් පැවතුණි. | | |
| (ඌ) | ප්‍රධාන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 05 ක් , ද්විතියික මට්ටමේ පුරප්පාඩු 25 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක් වර්ෂ 04 කට අධික කාලයක සිට පැවති නමුත් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකර ගෙන තිබුණි. එසේ වුවත් අත්‍යාවශ්‍ය නොවන එකී සේවක සංඛ්‍යාව යටපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇත. | අත්‍යාවශ්‍ය නොවන සේවක සංඛ්‍යාව යටපත් කිරීමට කටයුතු කළයුතු වේ. |

(එ) **උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 1992 අංක 5 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තියේ 3(1) වගන්තිය මඟින් අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ ප්‍රාග්ධනය එහි පාලක මණ්ඩලය වෙත පවරා තිබුණි. අරමුදලේ පාලක මණ්ඩලය ප්‍රධාන අමාත්‍යවරයා සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඇතුළු 06 දෙනෙකුගෙන් සමන්විත වූ අතර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය ප්‍රඥප්තියේ දක්වා නොතිබුණු බැවින් පළාත් සභාව විසුරුවා හරිනලද 2017 ඔක්තෝබර් 01 දින සිට අරමුදල අක්‍රියවී පැවතුණි. | පළාත් සභාව නැවත ආරම්භ කිරීමෙන් පසුව ප්‍රඥප්තිය සංශෝධනය කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ප්‍රඥප්තිය සංශෝධනය කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදලේ රු.4,425,249 ක මුදලක් දීර්ඝ කාලයක සිට ස්ථාවර තැන්පතුවක ද රු.5,663,736 ක මුදලක් 2018 වර්ෂයේ සිට වර්ෂ 04 ක කාලයක් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදලේ ජංගම ගිණුමේද රඳවා තිබුණු අතර එකී මුදල් උපයෝගි කරගෙන එම අරමුදල පිහිටුවීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගෙන ඇත. | අරමුදල සතු මුදල්, එය පිහිටුවීමෙන් ළගා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හෝ ප්‍රතිලාභ ලැබෙන ආයෝජන මාර්ගයක යෙදවීමට හෝ කටයුතු කළයුතු වේ. |

**1.5.3 ශීර්ෂය 611 - උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | --------------------- |
| (අ) | තමන්කඩුව ප්‍රාදේශීය සභාව, පොළොන්නරුව ප්‍රාදේශීය සභාව හා පොළොන්නරුව මහා නගර සභාව යනුවෙන් පළාත් පාලන ආයතන 02 ක් ලෙස වෙන්කිරීමේදී තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ බැංකු ගිණුම් 03 කට අදාළ ලියකියවිලි උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත භාරගෙන තිබුණු නමුත් එම ගිණුම් පියවා ඒවායේ තිබුණු රු.1,034,955 ක මුදල පොළොන්නරුව ප්‍රාදේශීය සභාව හා පොළොන්නරුව මහා නගර සභාව වෙත ලබාදී නොතිබුණු අතර එකී මුදල් 2022 ජුනි 15 දින වන විටද එම ගිණුම්වල අභාවිතව පැවතුණි. | මෙම මුදල් තමන්කඩුව ප්‍රාදේශීය සභාව විසින් එකතු කර ඇති අතර එහි සභාපතිවරයා මෙම මුදලින් කොටසක් පොළොන්නරුව මහ නගර සභාවට ලබාදීමට විරුද්ධ වූ බව දක්වා ඇත. | රු.1,034,955 ක මුදල උපයෝජනය කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | දුර ගමන් සේවා බස් නැවතුම්පොළක් ඉදිකිරීමේ අරමුණ ඇතිව බකමූණ මහවැලි ක්‍රීඩාංගනය ඉදිරිපිට භූමියේ පිහිටි කළුගලක් කඩා ඉවත් කිරීම සඳහා සහා අනුමැතිය ලබාගැනීම, ශක්‍යතා අධ්‍යන සිදුකිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, පරිසර බලපත්‍ර ලබාගැනීම සහ විධිමත් මූල්‍ය පරිපාටි අනුගමනය කිරීම යනාදී ක්‍රියාමාර්ග අනුගමනය නොකර 2015 – 2018 කාල පරිච්ඡේදයේදී ඇලහැර ප්‍රාදේශීය සභාව විසින් රු.15,675,708 ක මුදලක් වැයකර තිබුණු නමුත් එකී බස් නැවතුම්පොළ ඉදිකර නොතිබුණි. එසේ වුවත් ඒ පිළිබඳව උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගෙන ඇත. මෙම සිද්ධියට අදාල තැනැත්තන්ට එරෙහිව අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | විධිමත් මූල්‍ය පරිපාටි අනුගමනය නොකර මුදල් වැයකළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළයුතු වේ. |

**1.5.4 ශී**

**ශීර්ෂය 612 - උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 සිට 2020 දක්වා වූ වර්ෂ 05 ක කාලපරිච්ඡේදයේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵලවලින් පළාත් අනුව 2018 සහ 2019 වර්ෂවල දී 05 වන ස්ථානයේ සිටි උතුරු මැද පළාත 2020 වර්ෂයේදී 07 වන ස්ථානය දක්වා පසුබෑමට ලක්ව තිබුණි. එසේම එකී කාලපරිච්ඡේදයේ අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵලවලින් පළාත් අනුව 2018 සහ 2019 වර්ෂවල දී 07 වන ස්ථානයේ සිටි උතුරු මැද පළාත 2020 වර්ෂයේදී 08 වන ස්ථානය දක්වා පසුබෑමට ලක්ව තිබුණ ද පළාතේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා පාසල් මට්ටමින් ප්‍රශස්ත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකකර නොතිබුණි. | ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම්කල වැඩ සටහන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම නිසා මෙම තත්ත්වය ඇති වූ බව දක්වා ඇත. | පළාතේ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා පාසල් මට්ටමින් ප්‍රශස්ත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර පවත්වාගෙන යා යුතු වේ. |
| (ආ) | උතුරු මැද පළාතේ පාසල්වල ගුරු හා විදුහල්පති පුරප්පාඩු පැවතියදී ගුරුවරුන් 58 දෙනෙකු මාස 01 ත් වර්ෂ 27 ත් දක්වා කාලයක් වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර මුදාහළ දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය සඳහා ඔවුන්ට ගෙවා තිබුණු රු.147,348,894 ක වැටුප් හා දීමනා එම ගුරුවරු අනුයුක්ත ආයතන වෙතින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම වෙනත් ආයතනවලට මුදාහැර ඇති ගුරුවරුන්ට වැටුප් ගෙවීමේදී ඔවුන්ගේ සේවයට පැමිණීම හා නිවාඩු පිළිබඳ විස්තර අනිවාර්යයෙන්ම ලබාගතයුතු බවට 2021 ජූනි 30 දිනැති උතුරුමැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපියෙන් උපදෙස් දී ඇතත් ගුරුවරුන් 55 දෙනෙකුට අදාළ පැමිණීමේ හා නිවාඩු වාර්තා සහ මුදාහළ ආයතන විසින් ගෙවා ඇති දීමනා පිළිබඳ වාර්තා ලබාගෙන නොතිබුණි. | අනුරාධපුර අධ්‍යාපන කලාපයේ ගුරු භවතුන් 02 දෙනෙකුට අදාලවද, හිඟුරක්ගොඩ ගුරුභවතුන් 04 දෙනෙකුට අදාලවද වැටුප් ප්‍රතිපූර්ණය කරමින් පවතින අතර ජාතික ශිෂ්‍යභට බලකායට අනුයුක්ත කර ඇති මෙම ගුරුවරුන්ගේ සේවය සෘජුවම පාසල් වෙත ලැබෙන බැවින් ආරක්ෂක අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් ඔවුන්ගේ වැටුප් සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීමට හැකියාවක් නොමැති බව ආරක්ෂක අමාත්‍යාංශය විසින් දන්වා ඇති බව දක්වා ඇත. | පුරප්පාඩු පැවතියදී උතුරු මැද පළාතේ පාසල්වල ගුරුවරුන් වෙනත් ආයතනවලට මුදා හැරීම නොකළ යුතු අතර මුදාහැර ඇති ගුරුවරුන්ට අදාලව ගෙවා ඇති වැටුප් ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 උප වගන්තිය ප්‍රකාරව පරිවාසය පිට සිටින නිලධාරියෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු/ඇය සේවයෙහි ස්ථිර කිරීමට හෝ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා ක්‍රියා කළයුතු වුවත්, 1987 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ දී ගුරු සේවයට පත්වීම් ලබා දී තිබුණු ගුරුභවතුන් 239 කගේ සේවය ස්ථිර කිරීමට 2021 දෙසැම්බර් 31 වන විටද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කටයුතු කර නොතිබුණි. | තඹුත්තේගම කලාපයේ ගුරුවරුන් 04 දෙනෙකුටද, කැකිරාව කළාපයේ එක් ගුරුවරයෙකුටද, කැබිතිගොල්ලෑව කලාපයේ ගුරුවරු 39 දෙනෙකුටද අදාළ ලිපි ගොනු සම්පූර්ණ කර ස්ථිර කිරීම සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව දක්වා ඇත. | ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඈ) | කැබිතිගොල්ලෑව,තඹුත්තේගම හා කැකිරාව අධ්‍යාපන කලාපවලට අයත් පාසල් 13 ක ගුරුභවතුන් 61 දෙනෙකුගේ ශ්‍රේණි සඳහා උසස්වීම් ලබා දීමට වර්ෂයකට වඩා වැඩි කාල ප්‍රමාදයක් සිදු වී ඇති බව ගුරුභවතුන් 78 දෙනෙකු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය විය. | මාස 03 ක් ඇතුළත අදාල උසස්වීම් ලබාදීමට කටයුතු කරන බව දක්වා ඇත. | සියළුම ගුරුවරුන්ට නියමිත කාලය තුලදී උසස්වීම් ලබාදිය යුතු වේ. |
| (ඉ) | 2014 වර්ෂයේදී පරිත්‍යාගශීලියකු විසින් හොරොව්පතාන දුටුවැව විද්‍යාලයට ලබා දී තිබුණු නල ළිං සඳහා වූ ජල පොම්පය, විගණන පරීක්ෂණ දින වූ 2022 ජනවාරි 11 දින වන විට අස්ථානගත වී තිබුණු නමුත් ඒ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කිරීම, පොලිසියට පැමිණිලි කිරීම සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම විදුහල්පතිවරයා විසින් සිදුකර නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදුකිරීමට කටයුතු කරමින් පවතින බව දක්වා ඇත. | කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කිරීම, පොලිසියට පැමිණිලි කිරීම සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම සිදුකළයුතු වේ. |
| (ඊ) | හොරොව්පතාන දුටුවැව විද්‍යාලයේ 80'x20' ප්‍රමාණයේ පන්ති කාමර ගොඩනැගිල්ලක් රු.2,380,500 ක පුද්ගලික ධන පරිත්‍යාගයකින් ඉදිකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා 2019 ඔක්තෝබර් 23 දින ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය ලබා දී, එකී ඉදිකිරීම් දෙපාර්තමේන්තු පිරිවිතරවලට අනුව සහ ගොඩනැගිලි ඉංජිනේරු/ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලෙස උපදෙස් ලබා දී තිබුණද දෙපාර්තමේන්තු පිරිවිතරවලට අනුකූල නොවන ලෙස සහ ගොඩනැගිලි ඉංජිනේරු/ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණයෙන් තොරව සිදුකර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස්වලට හා දෙපාර්තමේන්තු පිරිවිතරවලට අනුකූලව ඉදිකිරීම් සිදුකළ යුතු වේ. |
| (ii) | ඉදිකිරීම් කටයුතු සඳහා ද්‍රව්‍ය මිලට ගැනීමට පත්කර තිබුණු විදුහල්පතිවරයා ඇතුළු 12 දෙනෙකුගෙන් සමන්විත කමිටුව විසින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා අනුමත කළ ඇස්තමේන්තු ප්‍රමාණයන්ට වඩා රු.120,700 ක් වටිනා වැලි කියුබ් 18.4 ක් මිලට ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා අනුමත කළ ඇස්තමේන්තුවේ දක්වා ඇති ප්‍රමාණයන් ඉක්මවා මිලට නොගත යුතු වේ. |
| (iii) | අඩි 03 අඟල් 06 ක අගුව සහිතව අමානෝ ෂීට් යොදා වහලය ආවරණය කිරීම සඳහා අඩි 02 අඟල් 06 ක පරතරයට දිග අඩි 19 ක වානේ පර්ලින් 56 කින් පේළි 12 ක් යෙදීමට ඇස්තමේන්තුවේ අංක 06 වැඩ විෂයයෙන් අනුමත කර ඇති නමුත් ඊට පටහැනිව අඩි 03 අඟල් 09 ක පරතරය සහිතව පර්ලින් පේළි 08 ක් යොදා තිබුණි. එසේම ඒ මත ඇස්බැස්ටොස් ෂීට් ආවරණය කර තිබුණු අතර වහලය සඳහා භාවිතා නොකළ අඩි 19 වානේ පර්ලින් 19 ක් නැවත රු.73,682 කට අලෙවිකර එම මුදලින් රු.30,500 ක් පමණක් 2020 පෙබරවාරි 14 දින පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකර තිබුණු අතර රු.43,182 ක් විදුහල්පතිවරයා විසින් අවභාවිතාකර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ඇස්තමේන්තුව ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (iv) | අනුමත ඇස්තමේන්තුවේ අංක 17 වැඩ විෂයය යටතේ ගොඩනැඟිල්ලේ වහලයේ මුදුනේ දිග අඩි 90 ක් වැසී යන සේ ZN/Al Colour bond ridge capping යෙදීමට රු.12,000 ක් වැයකර දිග අඩි100 ක් හා පළල අඩි 02 ක් වූ | පිළිතුරු ලබා දී නැත. | අක්‍රමිකතාවයන් සිදුකළ නිළධාරීන්ට එරෙහිව ක්‍රියා කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | තහඩු රෝලක් මිලට ගෙන තිබුණු නමුත් එම තහඩු රෝල ගොඩනැඟිල්ලේ වහලයට භාවිතා නොකර එය මිලට ගත් ආයතනයටම නැවත අලෙවිකර මුදල් ලබා ගෙන විදුහල්පතිවරයා විසින් අවභාවිතා කර තිබුණි. | | |
| (v) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව පාසල්වල අවිධිමත් ලෙස මුදල් අයකිරීම තහනම් කර තිබියදීත්, මෙම නව ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා පාසලේ ඉගෙනුම ලබන දරුවන්ගේ පවුලකින් රු.400 බැගින් එකතුව රු.60,000 ක මුදලක් විදුහල්පතිවරයා විසින් එකතුකර ඇති බවත්, ඒ සඳහා ලදුපත් නිකුත් කර නොමැති බවත්, එම මුදල අස්ථානගත වී ඇති බවත්, 2020 අගෝස්තු 17 දින පැවති පාසල් සංවර්ධන සමිතියේ රැස්වීම් වාර්තාවේ සඳහන් කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව අවිධිමත් ලෙස මුදල් අය නොකළ යුතුව තිබියදී මුදල් අයකළ නිළධාරීන්ට එරෙහිව ක්‍රියා කළ යුතු වේ. |
| (උ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.4,000,000 ක් වූ පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති 02 ක් ලංසුකරුවන් ලියකියවිලි අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම නිසා ඉටු නොකර අතහැර දමා තිබුණි. | ව්‍යාපෘති 02 ට අදාළව ලංසු ඉදිරිපත් කර තිබුණු ලංසු කරුවන් අවශ්‍ය ලියකියවිලි අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම නිසා මෙම ව්‍යාපෘති 2022 වර්ෂයේ සංවර්ධන සැලැස්මට ඇතුලත් කරන ලද බව දක්වා ඇත. | ලංසුකරුවන්ගෙන් අඩුපාඩු නොමැතිව ලියකියවිලි ලබාගෙන හෝ නැවත ලංසු කැඳවා හෝ අදාළ ව්‍යාපෘති නිමකළ යුතු වේ. |
| (ඌ) | 2021 වර්ෂයේ දී අධීක්ෂණය කිරීමට සැලසුම් සකස් කර තිබුණු කැකිරාව හා කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයන්හි පාසල් 140 කින් පාසල් 27 ක පමණක් අධීක්ෂණ කටයුතු සිදුකර තිබුණු අතර එහි ප්‍රගතිය සියයට 19 ක මට්ටමක පැවතුණි. | විවිධ හේතූන් මත පාසල් වසා තැබීම නිසා අධීක්ෂණය කිරීම අඩු මට්ටමක පැවතුණු බව දක්වා ඇත. | සැලසුම්කර ඇති පරිදි පාසල් වැඩි ප්‍රමාණයක් අධීක්ෂණය කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2021 වර්ෂයේ තඹුත්තේගම, කැකිරාව හා කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයන්හි සමාලෝචනයට භාජනය කර තිබුණු පාසල් 41 කින්, පාසල් 38 කම ගුණාත්මක දර්ශක අගය සියයට 70 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | වරින්වර පාසල් වසා දමා තිබීම නිසා ස්වයං ඇගයීම මෙන්ම බාහිර ඇගයීමද අඩුවීම මෙම තත්ත්වයට හේතු වී ඇති බව දක්වා ඇත. | ගුණාත්මක දර්ශක අගය සියයට 70 ට වඩා වැඩි පාසල්වල විභාග ප්‍රතිඵල ද ඉහළ මට්ටමක පැවතීම නිසා මෙම දර්ශක අගය ඉහළ නංවා ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඒ) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් 592 ක් සතු ගුරු හා විදුහල්පති නිවාස 1510 කින් වර්ග අඩි 831,004 ක ගුරු නිවාස 981 ක් අලුත්වැඩියා කළයුතු තත්ත්වයේද, වර්ග අඩි 206,719 ක ගුරු නිවාස 225 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයේද පැවති නමුත් අවශ්‍යතාවය හඳුනාගෙන එම ගුරු නිවාස අලුත්වැඩියා කර විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් වෙත ලබා දීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | මෙම ගුරු නිවාස වලින් බොහොමයක් වර්තමානයේදී අවශ්‍ය නොවන බව පෙනී යන බැවින් අවශ්‍යතාවය ඇත්නම් පමණක් අළුත්වැඩියාවන් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත | අවශ්‍යතාවය හඳුනාගෙන ගුරු නිවාස අළුත්වැඩියා කර විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් වෙත ලබා දීම කළයුතු වේ. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් 03 ක සේවය කරන ගුරුවරුන් 11 දෙනෙකුගෙන් රු.871,490 ක ගුරු නිවාස කුලී අයකර නොතිබුණු අතර කුලී අයකර නොතිබුණු කාල පරාසය වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා විය. | අදාල කුලී අයකර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | ගුරු නිවාසවල පදිංචි සියළු ගුරුවරුන්ගෙන් නිවාස කුලී අයකර ගතයුතු වේ. |
| (ඕ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණු තිරසාර සංවර්ධන අරමුණු 08 ක් ඉටුකර ගැනීම සඳහා තිරසර සංවර්ධන ඉලක්ක 20 ක් ස්ථාපිත කර තිබුණු අතර ඉන් ඉලක්ක 18 ක් වෙත ළඟාවීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.89,836,241 ක් වැය කර ව්‍යාපෘති 15 ක් ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවත් කුසලතා සංවර්ධනය වූ විශේෂ අධ්‍යාපන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සහ දහතුන් වසරක අඛණ්ඩ අධ්‍යාපන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යන ඉලක්ක 02 ක් ඉටුකර ගැනීම සඳහා කිසිඳු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | සෑම ඉලක්කයක්ම ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ක) | උතුරු මැද පළාතේ පාසල් 293 කට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අනුයුක්ත කර නොමැති වීම හේතුවෙන්, විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කිරීමට ගුරුවරුන්ට වැඩ බලන පත්වීම් ලබා දී තිබුණ ද, පාසල් 217 ක නියෝජ්‍ය විදුහල්පති තනතුරුවල රාජකාරි ඉටු කරන ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් පුරප්පාඩු පවතින පාසල්වලට මාරු කර විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කරවා ගැනීමට අවධානය යොමු කර නොතිබුණි. | පිළිගෙන ඇත. | පළාතේ ඇතැම් පාසල්වල නියෝජ්‍ය විදුහල්පති තනතුරුවල රාජකාරි ඉටු කරන ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් පුරප්පාඩු පවතින පාසල්වලට මාරු කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ග) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61211 (කාර්යාල කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 39 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 04දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරියෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 05 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුට සහ වැඩ තහනම් කළ නිලධාරින් දෙදෙනෙකුට අදාළව එකතුව රු.6,978,844 ක ණය ශේෂයන් මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් අයවීම් හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 08 දෙනෙකුට අදාළව රු.1,046,606 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් ගතවී තිබුණි. එසේ වුවත් එකී ණය ශේෂයන් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශයෙන් නියම කර ඇති පරිදි ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 1:6, 1:7, 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 වගන්තිවල | නිලධාරීන් 12 දෙනෙකුට අදාල රු.1,580,247 ක මුදලක් අයවී ඇති බව දක්වා ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශයෙන් නියම කර ඇති පරිදි නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | විධිවිධාන, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයේ විධිවිධාන සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ජ) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61201 (පාසල් කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 91 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 505 දෙනෙකුට, මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩලවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 295 දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 21 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 146 දෙනෙකුට, වැඩ තහනම් කළ නිලධාරීන් 20 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් 19 දෙනෙකුට සහ තොරතුරු අනාවරණය කරගත නොහැකි වූ නිලධාරීන් 93 දෙනෙකුට අදාළව එකතුව රු.75,454,646 ක ණය ශේෂයන් මාස 03 ත් වර්ෂ 31 ත් අතර කාලයක් අයවීම හිඟහිට තිබුණි. එසේම අනෙකුත් පළාත් සභාවල අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 13 දෙනෙකුට සහ මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩලවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 295 කුට අදාළ රු.26,454,817 ක ණය ශේෂයන් පියවීමට කටයුතු නොකර මාස 03 ත් වර්ෂ 24 ත් අතර කාලයක් ගතවී තිබුණි. එසේ වුවත් එකී ණය ශේෂයන් 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශයෙන් නියම කර | නිලධාරීන් 64 දෙනෙකුට අදාල රු.7,206,060 ක මුදලක් අයවී ඇති බව දක්වා ඇත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශයෙන් නියම කර ඇති පරිදි නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. |

ඇති පරිදි ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 1:6, 1:7, 3:18, 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 වගන්තිවල විධිවිධාන, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයේ විධිවිධාන සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------- | -------------------- | ----------------- | ----------------- |
| (ට) | 2018 මැයි 24 දිනැති අංක 07/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 10(I) උප වගන්තිය | රාජ්‍ය නිලධාරින් විශ්‍රාම ගන්වන දින හෝ ඊට පසු සතියක් ඇතුළත විශ්‍රාම වැටුප් ලිපිගොනු නිවැරදිව පිළියෙලකර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යැවීමට කටයුතු කළයුතු වුවත් කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ගුරුවරුන් 30 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ලිපි ගොනු ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට මාස 03 ත් මාස 13 ත් අතර කාලයක් ගෙන තිබුණි. | තඹුත්තේගම සහ කැකිරාව කලාප අධ්‍යාපන කාර්යාලවල ගුරුවරුන්ගේ ලිපි ගොනු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා ඇති බව දක්වා ඇත. | රාජ්‍ය නිලධාරින් විශ්‍රාම ගන්වන දින හෝ එදින සිට සතියක් ඇතුළත විශ්‍රාම වැටුප් ලිපිගොනු නිවැරදිව පිළියෙලකර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යැවිය යුතු වේ. |

**(ඩ) උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදලේ රු.13,000,000 ක මුදලක් දීර්ඝ කාලයක සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනකර තිබුණු අතර එකී මුදල උපයෝගී කරගෙන එම අරමුදල පිහිටුවීමෙන් ළගා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගෙන ඇත. | අරමුදල පිහිටුවීමෙන් ළගා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පියවර ගතයුතු වේ. |

**1.5.5 ශීර්ෂය 620 - උතුරු මැද පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක් දැක්ම කරගත් උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් උතුරු මැද පළාතේ වගා ළිං ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා වැයකර තිබුණු මුදල රුපියල් මිලියන 17.7 ක් විය. වගා ළිං 42 ක් අලුතින්ම ඉදිකර තිබුණු අතර කපා තිබුණු වගා ළිං 35 ක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් වගා ළිං 10 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ. | | |
| (i) | 2021 ජූලි 09 දිනැති අංක NCP/GOV/8/1/1 දරන වගා ළිං ඉදිකිරීම/ ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව ආණ්ඩුකාරවර ලේකම්වරයා විසින් නිකුත්කර ඇති ලිපියේ 04 ඡේදය ප්‍රකාරව කපා ඇති/ගරා වැටී ඇති ළිඳක් බැඳ ගැනීම සඳහා රු.200,000 ක් ගෙවිය හැකි නමුත් ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙත එකී සීමාව ඉක්මවා රු.350,000 ක් ගෙවා තිබුණි. | පිළිගෙන ඇත. | 2021 ජූලි 09 දිනැති අංක NCP/GOV/8/1/1 දරන ආණ්ඩුකාරවර ලේකම්වරයා විසින් නිකුත්කර ඇති ලිපිය අනුව කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | වාරි ඇළ මාර්ගවලින් ජලය ලබාගත හැකි කැකිරාව කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ ගොවීන් 02 දෙනෙකු වෙත රු.200,000 ක මුදලක් වගා ළිං ඉදිකිරීම සඳහා ගෙවා තිබුණි. | යල කන්නයේදී ජලය සපයා ගැනීම සඳහා මෙම වගා ළිං ආධාර ලබා දුන් බව දක්වා ඇත. | එක් කන්නයකට හෝ ජලය ලබාගත නොහැකි ඉඩම් බහුලව පවතින බැවින් එම ඉඩම් සඳහා වගා ළිං ආධාර ලබා දිය යුතු වේ. |
| (ආ) | පළාතේ කාබනික ආහාර නිෂ්පාදනය ඉහළ නන්වමින් රැකියා අවස්ථා උත්පාදනය සහ විෂ රසායනික සංඝටක වලින් තොර ආහාර පාරිභෝගිකයන්ට ලබාදෙමින් නිරෝගිමත්, සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහි කිරීම අරමුණු කරගෙන ඉහළ ගුණත්වයෙන් යුතු කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රෝද දෙකේ (02) ට්‍රැක්ටරයට සවිකළ හැකි කැබලි කිරීමේ යන්ත්‍ර 21 ක්, එකක් රු.682,500 බැගින්ද, රෝද හතරේ (04) ට්‍රැක්ටරයට සවිකළ හැකි කැබලි කිරීමේ යන්ත්‍ර 90 ක්, එකක් රු.710,000 ක් බැගින්ද මිලට ගැනීමට රු.77,572,500 ක් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වැයකර තිබුණු අතර එකී යන්ත්‍ර ප්‍රතිලාභීන් වෙත බෙදා දී තිබුණි. එසේ වුවත් යන්ත්‍ර 06 ක් කාබනික පොහොර නිෂ්පාදනයට යොදා ගෙන නොතිබුණු අතර එක් යන්ත්‍රයක් ප්‍රතිලාභියකු විසින් තමන්ගේ වගාවන්ට අවශ්‍ය කාබනික පොහොර පමණක් නිෂ්පාදනය සඳහා යොදවා තිබුණි. එසේම පොහොරවල ප්‍රමිතිය පරීක්ෂාකර ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් සකස්කර නොතිබීම නිසා යන්ත්‍ර 02 කින් නිෂ්පාදනය කරනු ලබන කාබනික පොහොර අලෙවි කර ගැනීමට නොහැකි වී තිබුණු බව යන්ත්‍ර 11 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ අතර නිපදවනු ලබන කාබනික පොහොර සඳහා ස්ථාවර මිලක් නොතිබීමත්, ඒවා මිලට ගැනීමට සහ ගොවීන් වෙත බෙදා හැරීමට ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් පිළියෙල කර නොතිබීමත් හේතුවෙන් එකී පොහොර අදාළ ප්‍රතිලාභීන් විසින් ගබඩාකර තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව ගොවීන් විසින් කාබනික පොහොර යෙදීම ප්‍රතික්ෂේප කිරීම නිසා නිෂ්පාදනය කළ පොහොර අලෙවි කරගත නොහැකි වීමෙන් ව්‍යාපෘතිය අසාර්ථක වී ඇත. | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වැයකල රු.77,572,500 ක මුදල නිෂ්කාර්යය නොවන ලෙස කටයුතු කළයුතු වේ. |
| (ඇ) | උතුරු මැද පළාතේ පවතින දිළිඳුබව අඩු කිරීමට සහයවීම අරමුණු කරගෙන උතුරු මැද පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් සඳහා සහනාධාර පදනම මත උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් | මහා පරිමාණ ව්‍යවසායකයින්ට මෙම උපකරණ ලබා දෙන ලද්දේ ඔවුන් විසින් සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ විසිතුරු | සුළු පරිමාණ ව්‍යවසායකයින්ගේ විසිතුරු මසුන් මිලට ගැනීමෙන් මහා පරිමාණ ව්‍යවසායකයින් |

| | | | |
|---|---|---|---|
| | 2021 වර්ෂයේදී ප්‍රතිලාභීදායකත්වයද ඇතුළුව රු.17,657,686 ක් ගෙවා සෙවණ දැල් 150 ක්, වට ආවරණ දැල් 250 ක්, කුරුළු දැල් 283 ක් සහ GI බට 1200 ක් මිලට ගෙන තිබුණි. මහා පරිමාණ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් 04 දෙනෙකුටද එකී උපකරණ බෙදා දී තිබුණු බව නියැදි විගණනයේදී අනාවරණය විය.මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට මෙම උපකරණ බෙදා දීමෙන් පළාතේ පවතින දිළිඳු බව අඩු කිරීමේ ව්‍යාපෘති අරමුණ ඉටු නොවන බව නිරීක්ෂණය විය. | මසුන්ද මිලට ගෙන අපනයනකරුවන්ට ලබාදීමෙන් සුළු පරිමාණ ව්‍යවසායකයින්ට වැඩි ප්‍රතිලාභයක් හිමිවන බව දක්වා ඇත. | ලාභයක් උපයන බැවින් මහා පරිමාණ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් වෙත එකී උපකරණ, සහනාධාර පදනම මත බෙදා දීමේ අවශ්‍යතාවයක් නොවේ. |
| (ඇ) | උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු මිරිදිය මත්ස්‍ය ප්‍රවර්ධන වැඩසටහන යටතේ මිරිදිය ධීවරයින් වෙත ලබාදීම සඳහා 2021 වර්ෂයේදී ඔරු 119 ක් සහ කොල්ලෑ 23 ක් රු.9,068,126 ක් ගෙවා මිලට ගෙන තිබුණි. ධීවරයින් වෙත ලබාදෙනු ලබන මෙම උපකරණ අන්සතු නොකර ධීවර කර්මාන්තයේ යෙදිය යුතු නමුත් ඇතැම් ධීවරයින් විසින් එකී උපකරණ අන්සතු කර තිබුණු අතර ඇතැම් උපකරණ විවිධ හේතුන් මත මිරිදිය ධීවර කර්මාන්තය සඳහා යොදවා නොතිබුණි. එසේ වුවත් එකී ආම්පන්න ආපසු ලබාගෙන වෙනත් ධීවරයින් සඳහා ලබාදීමට කටයුතු කර නොතිබුණි. | වාරකන් කාලයට මෙම ප්‍රතිලාභීන් මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන බව දක්වා ඇත. | උපකරණ අන්සතු නොකර ධීවර කර්මාන්තයේ යෙදිය යුතු වේ. |

**1.5.6 ශීර්ෂය 621 – උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| **උතුරු මැද පළාත් කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම** | | |
| (අ) උතුරු මැද පළාත් කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මෙහෙයුම් කටයුතු වෙනුවෙන් පවත්වාගෙන යන ජංගම ගිණුමට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතුව රු.595,537 ක් වූ හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගෙන ඇත | හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) උතුරු මැද පළාත් කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම් කටයුත්තක ක්ෂය කරන ලද වත්කම් ප්‍රතිසම්පාදනය සඳහා වැය වන මුදල පියවා ගැනීමට හැකිවන ලෙස උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය රීති 377.1 ප්‍රකාරව ප්‍රාග්ධන වත්කම්වල වාර්ෂික ක්ෂය"පොදු තැන්පත් ගිණුම- ක්ෂය සංචිත අරමුදලට" බැර කිරීම පිණිස පළාත් භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වේ. එසේ වුවත් කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම් කටයුත්තේ ප්‍රාග්ධන වත්කම්වලට අදාළ ව 2021 දෙසැම්බර් 31 දිනට ක්ෂය ගණනය කර පළාත් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇත. 2021 වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ ගැලපීම් සහ 2022 වර්ෂයේ සිට ඉදිරියට නියමිත පරිදි අවශ්‍ය කටයුතු කරන බව දක්වා ඇත. | උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය රීති 377.1 ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

**1.5.7 ශීර්ෂය 622 – උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| **උතුරු මැද පළාත් සත්ත්ව සංවර්ධන අත්තිකාරම් ගිණුම** | | |

| | | |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ තිරප්පනේ සත්ත්ව ගොවිපොළ සතු ගොඩනැඟිලි, සත්ත්ව ගාල්, වාහන සහ උපකරණ යනාදියේ වටිනාකම අගය කර, දේපළ පිරියත උපකරණ ලේඛනයේ සටහන් කර ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී වත්කම්වල වටිනාකම තක්සේරුකර ගිණුම් තැබීමට කටයුතු කරන බව දක්වා ඇත. | සියළු වත්කම් දේපළ පිරියත උපකරණ ලේඛනයේ සටහන් කර ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි විධිවිධාන ප්‍රකාරව කෘෂිකාර්මික ආයතන විසින් ජීව විද්‍යාත්මක වත්කම් ගිණුම්ගත කිරීමේදී හෙළිදරව් කළ යුතු පහත සඳහන් කරුණු අත්තිකාරම් ගිණුමෙහි හෙළිදරව් කර නොතිබුණි.<br>(i) අස්ථිත්වයේ සෑම ජීව විද්‍යාත්මක වත්කම් කාණ්ඩයක් පිළිබඳවම විස්තරයක්.<br>(ii) එක් එක් කාණ්ඩයේ ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධ ව ඒවායේ ක්‍රියාකාරකම්වල ස්වභාවය පිළිබඳ විස්තර.<br>(iii) කාල පරිච්ඡේදය අවසානයේදී අස්ථිත්වයේ සෑම ජීව විද්‍යාත්මක වත්කම් සමූහයකම භෞතික ප්‍රමාණයන්හි මූල්‍යමය නොවන මිනුම් හෝ ඇස්තමේන්තු විස්තර.<br>(iv) අස්ථිත්වය විසින් සෑම කාණ්ඩයකම ජීව විද්‍යාත්මක වත්කම්වල සාධාරණ වටිනාකම නිශ්චය කිරීමේදී භාවිතා කළ ක්‍රම සහ වැදගත් උපකල්පනයන්. | පෙන්වා දී ඇති පරිදි 2022 වර්ෂයේ සිට කටයුතු කරන බව දක්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 18 හි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළයුතු වේ. |

**1.5.8 ශීර්ෂය 631 - උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------- |
| (අ) 2013 සැප්තැම්බර් 02 දිනැති අංක 02-133/2013 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය සහ ඖෂධ කළමනාකරණ අත්පොතේ 03 ඡේදයේ 4(a) හා (b) ඡේද ප්‍රකාරව වර්ෂයක දී අවස්ථා 06 ක් | ඉදිරියේදී නියමිත පරිදි මෙම කමිටු පැවැත්වීමට කටයුතු කරන ලෙස නියෝග කිරීමට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ඖෂධ චිකිත්සක කමිටු රැස්වීම(Institutional Drug Therapeutic Committee) 2013 සැප්තැම්බර් 02 දිනැති අංක 02-133/2013 |

| | | | |
|---|---|---|---|
| | පැවැත්විය යුතු ඖෂධ චිකිත්සක කමිටු රැස්වීම්(Institutional Drug Therapeutic Committee) පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය විසින් 2019 වර්ෂය සඳහා එක් අවස්ථාවකදී ද, 2021 වර්ෂය සඳහා එක් අවස්ථාවකදී ද පවත්වා තිබුණු අතර, 2020 වර්ෂය සඳහා එම කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | වෙත දන්වා ඇත. | දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය සහ ඖෂධ කළමනාකරණ අත්පොතේ 03 ඡේදයේ 4(a) හා (b) ඡේද ප්‍රකාරව පැවැත්විය යුතු වේ. |
| (ආ) | භාවිතයෙන් ඉවත්කළ ඖෂධ තොග විනාශ කරන තෙක් වර්ෂ 04 කට අධික කාලයක් තිස්සේ උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ඖෂධ සැපයුම් අංශයේ ඖෂධ ගබඩාවෙහි අනාරක්ෂිතව ගොඩ ගසා තිබුණු අතර, එකී ඖෂධ තොග සම්බන්ධයෙන් ඒවායේ නම්, නිෂ්පාදිත දිනය, ඖෂධ ගබඩාවට ලැබී තිබුණු දිනය, කල් ඉකුත් වූ දිනය සහ ප්‍රමාණය යනාදි තොරතුරු ද දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. එසේම කල්ඉකුත් වූ ඖෂධ වර්ග 75 ක් හා ශල්‍ය උපකරණ 83 ක් 2018 වර්ෂයේ සිට එකී ගබඩාවේ ද, 2017 වර්ෂයේ සිට කල්ඉකුත් වී තිබුණු අයිතම 124 කට අදාළ ඖෂධ ඒකක 294,813 ක් පොළොන්නරුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ගබඩාවල ද, ඇස්තමේන්තු නොකළ හා ඉල්ලා නොතිබුණු නමුත් 2020/2021 වර්ෂවල දී ලැබී තිබුණු ඖෂධවලින් කල් ඉකුත් වී ඇති ඖෂධ වර්ග 1684 ක් අනුරාධපුර ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ ද පැවතුණි. | ගබඩාවල ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම නිසා භාවිතයෙන් ඉවත්කළ ඖෂධ තොගද සාමාන්‍ය ඖෂධ ගබඩාවේම ගබඩාකර ඇති බව දක්වා ඇත. | භාවිතයෙන් ඉවත්කළ ඖෂධ තොග, සාමාන්‍ය ඖෂධ තොග සමඟ එකම ගබඩාවක ගබඩා නොකළ යුතු වේ. |
| (ඇ) | අනුරාධපුර ප්‍රාදේශීය ඖෂධ සැපයුම් අංශයේ භෞතික තොග ශේෂයන් වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධතියේ (MSMIS) ශේෂයන් සමඟ සැසඳීමේ පද්ධති තොග සත්‍යාපනය (System Verification) 2018 දෙසැම්බර් 31 දිනෙන් පසුව සිදුකර නොතිබුණු අතර උතුරු මැද පළාතේ ප්‍රාදේශීය රෝහල් 22 ක වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධති (MSMIS) ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රාදේශීය රෝහල් 22 හි වෛද්‍ය සැපයුම් කළමනාකරණ දත්ත පද්ධති (MSMIS) ස්ථාපිත කරන ලෙස අදාළ අංශයන්ට දැන්වීමට කටයුතු කරන අතර සෙසු රෝහල් වල භෞතික තොග ශේෂයන්, දත්ත පද්ධතියේ ශේෂයන් සමඟ සැසඳීමට පද්ධති තොග සත්‍යාපනය 2022 වර්ෂයේ සිට සිදුකිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | පද්ධති තොග සත්‍යාපනයන් (System Verification) සෑම වර්ෂයකදීම සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නාච්චාදූව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉදිකිරීම සඳහා වූ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.37,330,840 ක් වූ අතර ඉදිරිපත් වී තිබුණු එකම ලංසුව රු.43,038,725 ක් විය. එකී ලංසුව, ඉංජිනේරු ඇස්තමේන්තුව රු.5,707,885 කින් ඉක්මවා තිබුණු නමුත් ඉංජිනේරු ඇස්තමේන්තුවට අදාළ කාර්ය ඉටුකරවා ගැනීමට කොන්ත්‍රාත්කරු එකඟ කරවා ගැනීම හෝ නැවත ලංසු කැඳවීම හෝ සිදු නොකර ලංසුකරුගේ වටිනාකමට 2021 ඔක්තෝබර් 28 දින උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව ගිවිසුම්ගතව රු.12,660,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් ද ගෙවා තිබුණි. ඉදිකිරීමට යෝජිත භූමියේ අයිතිය පිළිබඳ නෛතික හා පරිපාලනමය වශයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් නොදක්වා තිබීම හේතුවෙන් පසුව ඇති වූ ගැටලුවක් පදනම් කරගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර පළාත් පාලන ආයතනයක් විසින් එහි ස්ථිර ඉදිකිරීමක් සිදුකර තිබුණි. එසේ වුවත් ගෙවා තිබුණු රු.12,660,000 ක අත්තිකාරම් මුදල් අයකර ගෙන නොතිබුණි. | අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කරන අතර වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණයක් සිදුකරන බව දක්වා ඇත. | අත්තිකාරම් මුදල් අයකර ගතයුතු අතර වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කඩිනමින් විනය ක්‍රියා මාර්ග ගතයුතු වේ. |
| (ඉ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සතු ආයතන 124 හි, 2021 දෙසැම්බර් 31 දිනට ඇති ඉඩම් හා ගොඩනැගිලිවලින් ඉඩම් 05 ක සහ ගොඩනැගිලි 17 ක වටිනාකම් පමණක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුණි. | මාස 02 ක් ඇතුළත විධිමත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | සියළු වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළයුතු වේ. |
| (ඊ) | උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සතු රජයේ නිවාස 293 න්, 201 ක නිලධාරීන් පදිංචිව සිටින නමුත් ඉන් රජයේ නිවාස 27 කින් කුලී අයකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | රජයේ නිවාස වල පදිංචි සියළු නිලධාරීන්ගෙන් නිවාස කුලී අයකර ගතයුතු වේ. |
| (උ) | භාවිතයෙන් ඉවත්කර තිබුණු පොළොන්නරුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 05 ක්, පුලස්තිගම හා ජයන්තිපුර රෝහල් පරිශ්‍රයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණු අතර, තවත් වාහන 06 ක් අලුත්වැඩියා කළ යුතුව පැවතීමෙන් ධාවනයෙන් ඉවත්කර තිබුණි. | වටිනාකම තක්සේරුකර Micro වාහන 06 ඉදිරි කටයුතු සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බව දක්වා ඇත | ඉතිරි වාහන අළුත්වැඩියාකර භාවිතා කිරීම හෝ එසේ කළ නොහැකි නම් වෙන්දේසි කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඌ) | තඹුත්තේගම සහ කැබිතිගොල්ලෑව යන රෝහල් දෙකෙහි රුධිර කාන්දුකරණ ඒකක ජනතා අයිතියට පවරා දී තිබුණු නමුත්, 2020 දෙසැම්බර් 31 දින වනතුරුත් කළමනාකරණයේ දුර්වලතාවයන් මත ආරම්භ කිරීමට අසමත්වී | පිළිගෙන ඇත. | වකුගඩු රෝගීන් වෙත ප්‍රතිලාභ ලබාදීමේ අරමුණ ඉටුකර ගැනීමට ක්‍රියා කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. ඒ අනුව මෙම රෝහල් 02 ක සඳහා ලබාදී තිබුණු රුධිර කාන්දුකරණ යන්ත්‍ර 08 ද ඇතුළුව වියදම් කර තිබුණු රු.මි. 90.8 ක මුදලින් වකුගඩු රෝගීන් වෙත කිසිදු ප්‍රතිකාරයක් ලැබී නොතිබුණු අතර, එකී ගොඩනැගිලි සහ උපකරණ අභාවිතව පැවතුණි. | | |
| (එ) | සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී සිදුකළ අනුරාධපුර පළාත් වෛද්‍ය සැපයුම් අංශයේ ගබඩා සංකීර්ණය අලුත්වැඩියාවට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තුව රු.4,166,085 ක් වූ අතර රු.3,339,057 ක අවම ලංසුව මත ගිවිසුම්ගතව තිබුණි. එසේ වුවත් ගිවිසුම්ගත මුදල සියයට 18 කින් එනම් රු.593,733 කින් ඉක්මවා රු.3,932,790 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එය ඊළඟ අවම ලංසුව රු.478,219 කින් ඉක්මවා යෑමක් බව නිරීක්ෂණය කෙරේ. | හේතු සොයා බැලීමට පරීක්ෂයක් සිදුකිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ගිවිසුමට අනුකූලව පමණක් ගෙවීම් කළයුතු වේ. |
| (ඒ) | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 14 ක් සහ අනිකුත් වෛද්‍ය නිලධාරීන් 42 ක් ඇතුළු සෞඛ්‍ය කාර්යය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 633 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇත. | සෞඛ්‍ය කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වේ. |

**1.5.9 ශීර්ෂය 632 - උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------ | ------------- |
| රජයේ අරමුදල් යොදවා සංවර්ධනය කර දැනට පවත්වාගෙන යනු ලබන අක්කර 27 ක ගාලදිවුල්වැව ඔසු උයන, අක්කර 03 ක නඳුන් සෙවණ, තෙලිහිරියාව ඔසු උයන සහ රූඩ් 02 පර්චස් 12 ක පලුගස්වැව ඔසු උයන යනාදියේ හිමිකාරිත්වය ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියෙන් සහ පලුගස්වැව ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද නොහැකි වී තිබුණි. | මෙම ඔසු උයන් මහවැලි කළාපවල පවතින අතර මහවැලි අධිකාරිය එම ඉඩම්වල අයිතිය පවරා දීමට අකමැති බව දක්වා ඇත. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කරන ඔසු උයන්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගතයුතු වේ. |

**1.5.10 ශීර්ෂය 640 - උතුරු මැද පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | ---------------------- | -------------------------------- | -------------- |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 9.6 ඡේදය ප්‍රකාරව රජයේ නිවාඩු දිනක රාජකාරි සඳහා ගමන් කිරීම, නිවාඩු දින වැටුප් ගෙවීමේ කාර්ය සඳහා වැඩ කිරීමක් ලෙස ගණන් නොගත යුතු අතර, එකී ගමන නියම වශයෙන්ම රාජකාරියක් ඉටු කිරීම සඳහාම කරන ලද්දක් නම් ඒ වෙනුවෙන් හිලව් නිවාඩුවක් පමණක් ලබාගත හැකි නමුත්, පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළඳ, ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර රාජකාරි සඳහා කාර්යාලයෙන් බැහැර යාම වෙනුවෙන් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 23 කදී රු.368,267 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | පිළිගෙන ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 9.6 ඡේදය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ආ) | පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළඳ, ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සතු රු.30,500,000 ක් වටිනා වාහන 02 ක් දීර්ඝ කාලයක සිට නිසි අලුත්වැඩියාවක් හා නඩත්තුවක් නොමැති වීමෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයට අබලන්ව පැවතුණි. | පිළිගෙන ඇත | වාහන 02 අළුත්වැඩියාකර භාවිතා කිරීම හෝ එසේ කළ නොහැකි නම් වෙන්දේසි කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පරිශීලක ගිණුම් සහ ඒවාට අදාළව පළාත් මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ admin විසින් ලබාදෙන මුරපද වෙනස් නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාවිතා කර තිබීම, දෙපාර්තමේන්තුවේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කවුළු වෙත ලබා දී ඇති පරිශීලක ගිණුම්වලට අදාළ මුරපද දෙපාර්තමේන්තුවේ admin විසින් ගොනුකර තිබීම, දෙපාර්තමේන්තුවේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කවුළුවල රාජකාරී කරන පුද්ගලයා වෙත Operator, Supervisor සහ | පිළිගෙන ඇත. අවශ්‍ය මඟ පෙන්වීම් සහ නියෝග නිකුත් කරමින් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | වාහන ආදායම් බලපත්‍ර ආදායම් වංචා කිරීම වළක්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පාලන පිළිවෙත් හඳුන්වාදීම සහ එකී පාලන පිළිවෙත් නිසියාකාරව ක්‍රියාත්මක වන බවට වගබලා ගතයුතු වේ. |

**1.5.11 ශීර්ෂය 641 - උතුරු මැද පළාත්**

Admin යන පරිශීලක ගිණුම් 03 සහ ඒවාට අදාළ මුරපද ලබා දී තිබීම, අධිකාරී බලය සහිත ලිඛිත අවසරයකින් තොරව පද්ධතියට පරිශීලකයින් ඇතුළත් කිරීමට ඇති හැකියාව, අන්තර් ජාලයේ පවතින උබුන්ටු (UBUNTU) මෙහෙයුම් පද්ධතිය ස්ථාපනය කරගෙන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියට ප්‍රවේශ වීමට හැකියාවක් පැවතීම යනා දී පද්ධතියේ සහ ආයතනයේ පවතින දෝෂ හේතුවෙන් අවසරයකින් තොරව එම කාර්යාලවල ඕනෑම නිලධාරියෙකුට උතුරු මැද පළාත් මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවේ ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියට ඇතුළු වී වංචනික ලෙස ඉකුත් වර්ෂයේ ආදායම් බලපත්‍රය, දුම් සහතිකය, රක්ෂණ සහතිකය නොමැතිව ආදායම් බලපත්‍ර නිකුත් කිරීම, නිකුත් කළ ආදායම් බලපත්‍රවලට අදාළ තොරතුරු මකා දැමීම, වෙනස් කිරීම, හිඟ ආදායම් මකා දැමීම යනාදිය මගින් වාහන ආදායම් බලපත්‍ර ආදායම් වංචා කිරීමේ හැකියාව පවතී. එසේම මෙසේ සිදුකළ වංචාවන් පැවතියද එකී වංචාවන් සිදුකරනු ලැබ ඇත්තේ කවුරුන් විසින්ද? යන්න සොයා ගැනීමට, මෙම පද්ධතිය උතුරු මැද පළාත් මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවට අලෙවි කර ඇති ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයටද නොහැකි බව ද ප්‍රකාශ කර ඇත.

**සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------ | ------------- |
| (අ) | සමුපකාර සමිති විසින් ඒවායේ සාමාජිකයින්ට/ සේවකයින්ට ලබාදී ඇති ණය ආපසු අයකර ගැනීමේ දී ඇතිවන ආරවුල් විසඳීම හෙවත් තීරකකරණය, 2009 අංක 05 දරන උතුරු මැද පළාත් සමුපකාර ප්‍රඥප්තියේ 58(2) වගන්තිය ප්‍රකාරව සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇති අතර 2021 | තීරකකරණය අවසන් කර නැති ආරවුල් ගණන 306 ක් වූ අතර බලගන්වන ලද ආරවුල් වලට අදාළ උසාවි දඩ මුදල රු.215,055 ක් බව දක්වා ඇත. | සියළු තීරකකරණ කටයුතු අප්‍රමාදව අවසන් කළයුතු අතර තීරකකරණය නිමකළ ආරවුල් සඳහා ලැබී ඇති උසාවි දඩ මුදල්වලට අදාළ සමුපකාර සමිති හඳුනාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති වී තිබුණු ආරවුල් 1774 කින් ආරවුල් 306 කට අදාළව තීරකකරණය අවසන්කර නොතිබුණි. එසේම ආරවුල් බේරුම් කිරීමේ ගාස්තු හා තීරකකරණය නිමකළ ආරවුල්වලට අදාළ උසාවි දඩ මුදල් ලැබීම් වලින් රු.215,055 ක මුදලකට අදාළ සමුපකාර සමිති හඳුනාගත නොහැකිවී තිබුණි. | | |
| (ආ) | 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58(3) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් වන තීරක ආරවුල් නිරවුල් කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබෙන අභියාචන සම්බන්ධයෙන් කටයුතු කළයුතු වුවද, උතුරු මැද පළාත් සමුපකාර කොමසාරිස්/ රෙජිස්ට්‍රාර් වෙත ලැබී තිබූ අභියාචන 40 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම අභියාචන වෙනුවෙන් අභියාචනාකරුවන් විසින් රු.2,075,850 ක අභියාචනා තැන්පතු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ තැන්පත් කර තිබුණි. | මින් අභියාචනා 05 ට අදාළ කටයුතු අවසන් කර ඇති බව දක්වා ඇත. | සියළු අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු අවසන් කළයුතු වේ. |
| (ඇ) | උතුරු මැද පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | | |
| | ------------------------------------------------------------------------------------------------------------ | | |
| (i) | උතුරු මැද පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අදාළ 2015, 2016, 2017, 2018, සහ 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම නිසා විගණනයට ඉදිරිපත් කර තිබුණු 2020 සහ 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමට නොහැකි ව තිබුණි. | හැකි ඉක්මනින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නියමිත දින විගණනයට ඉදිරිපත් කළයුතු වේ. |
| (ii) | අරමුදලේ සාමාජිකත්වය ලබාගෙන ඇති දැනට සේවය කරන සාමාජිකයන්ගෙන් මාසිකව රු.500 ක් බැගින් ද, එක් එක් සේවකයා වෙනුවෙන් සමුපකාර සමිතිය විසින් රු.500 ක් බැගින් ද උතුරු මැද පළාත් සභාව විසින් වාර්ෂිකව රු.මිලියන 10 ක් බැගින්ද සමුපකාර සේවක විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අරමුදලට බැරකරන අතර, වාර්ෂිකව විශ්‍රාමිකයින් 550 දෙනෙකුට විශ්‍රාම වැටුප් වශයෙන් රු.මිලියන 13 කට අධික මුදලක් ගෙවීමට සිදුව ඇත. එසේ වුවත් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය | පිළිගෙන ඇත. ඉදිරියේදී මෙම ගැටළු විසඳා ගැනීමට හැකිවන ලෙස සංශෝධනයන් සිදුකරනු කරන බව දක්වා ඇත. | සියළු සාමාජිකයන්ට ප්‍රතිලාභ ලැබෙන අයුරින් කටයුතු සිදුකළ යුතු වේ. |

රු.මිලියන 13 කට ආසන්න වී තිබුණු අතර 2018 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයේ දී ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබා ඇති සාමාජිකයින් 34 දෙනෙකු වෙත ගෙවිය යුතු රු.2,854,037 ක හිඟ විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ සහ 2011 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා විශ්‍රාම ගොස් තිබුණු සාමාජිකයින් 07 දෙනෙකු වෙත එකවර ගෙවිය යුතු රු.312,602 ක විශ්‍රාම ප්‍රතිලාභ ගෙවා නොතිබුණි. ඒ අනුව මෙම අරමුදලින් ප්‍රතිලාභ ගෙවීම තිරසර තත්ත්වයක නොමැති බව නිරීක්ෂණය විය.

**1.5.12 ශීර්ෂය 642 - පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (අ) | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විස්කම් පියස ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යන ප්‍රදර්ශනාගාර කඩ කාමර 42 කින් 2016 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව අයවිය යුතු රු. 1,722,075 ක් වූ කුලිය හිඟව පැවතුණු අතර එම කඩ කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීත්‍යානුකූලව කුලී අයකර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | නියමිත පරිදි කුලිය අයකර ගැනීමට කටයුතු සිදු කළයුතු වේ. |
| (ආ) | පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාරව වාහන අනතුරක් සම්බන්ධයෙන් අනතුර සිදු වී මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් පිළියෙල කළයුතු වුවත්, 2021 මාර්තු 17 දින අනතුරට පත්වී තිබුණු පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් සම්බන්ධයෙන් විගණිත දින වූ 2022 මැයි 30 දින වන විටද, පූර්ණ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. මෙම කැබ් රථය සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබුණු නමුත් වාහනයේ විලායනයක් (ෆියුස්) නිසි | ප්‍රාරම්භක වාර්තාව අනුව අලාභය රු.109,500 ක් බව දක්වා ඇත. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළයුතු අතර රක්ෂණ වන්දි ලබාගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම කළයුතු වේ. |

| | | |
|---|---|---|
| ප්‍රමිතියෙන් තොරව සම්බන්ධ කිරීම හේතුවෙන් ප්‍රාරම්භක වාර්තාව අනුව වූ රු.109,500 ක අලාභය සඳහා රක්ෂණ වන්දි ලබාගැනීමට අපොහොසත් වී තිබුණි. | | |

(ඇ) උතුරු මැද පළාත් වඩු පාසල් කටයුතු අත්තිකාරම් ගිණුම

---

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වඩු පාසල් කටයුතු අත්තිකාරම් ගිණුමේ නිෂ්පාදන, ණය පදනම මත විකිණීම හේතුවෙන් වර්ෂ 02 කට වැඩි කාලයක් හිඟව පැවති ණයගැති ශේෂය රු.1,903,236 ක් වූ අතර, ඉන් වර්ෂ 04 ඉක්මවූ ණය ශේෂය රු.1,041,261 ක් විය. | පිළිගෙන ඇත. | සියළු ණය අයකර ගතයුතු වේ. |

(ඇ) උතුරු මැද පළාත් පේෂකර්මාන්ත කටයුතු අත්තිකාරම් ගිණුම

---

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පේෂකර්මාන්ත කටයුතු අත්තිකාරම් ගිණුමේ විකුණුම් රු.13,856,294 ක් වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට අත් යන්ත්‍ර රෙදිපිළිවල පිරිවැයට ගණනය කරන ලද නිමි තොගය රු.40,057,252 ක් විය. අවසන් තොගය විකුණුම්වලින් සියයට 289 ක් වූ අතර එය විකුණුම් බවට පත්වීමට වර්ෂ 03 කට ආසන්න කාලයක් ගතවන බැවින්, අත්යන්ත්‍ර රෙදිපිළි නිමි තොගයේ ශුද්ධ උපලබ්ධි අගය ඉතා අඩු අගයක් විය හැකි බව නිරීක්ෂණය කෙරේ. | නිමි තොගය නිෂ්පාදන පිරිවැයට ආගනණය කර ඇත. එය ඉදිරියේදී ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට තොග ගණනය කළයුතු වේ. |

**1.5.13 ශීර්ෂය 651 - උතුරු මැද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උතුරු මැද පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අත්තිකාරම් ගිණුම | | |
| එක් එක් ස්ථාවර වත්කම් විෂයයට අදාළ ව | පිළිගනිමි. | ඉදිරියේදී පළාත් මූල්‍ය රීති 368.2 |

| | | |
|---|---|---|
| එහි පිරිවැය හැඳින්වීම, අත්පත් කරගත් දිනය, වාර්ෂික ක්ෂය අනුපාතිකය සහ පිහිටීම ආදී සම්පූර්ණ විස්තර ඇතුළත් කර පළාත් මූල්‍ය රීති 368.2 ප්‍රකාරව අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළයුතු වේ. |

**1.5.14 ශීර්ෂය 653 – පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ---------------------- |
| | උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල් ගිණුම | | |
| (i) | උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරමාර්ථ හා අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 03 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 26(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාම සංවර්ධන අරමුදල පිහිටුවා ඇති නමුත් 2021 දෙසැම්බර් 31 දින අරමුදලේ බැංකු ගිණුමේ වූ රු.1,581,477 ක මුදල එකී පරමාර්ථ හා අරමුණු ඉටු කරගැනීම සඳහා යොදවාගෙන නොතිබුණි. | ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරමාර්ථ හා අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අරමුදල කටයුතු කළයුතු වේ. |
| (ii) | ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රකාරව ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි රීති මඟින් අරමුදල පාලනය කළයුතු වුවත් ප්‍රඥප්තිය සම්මත කර වර්ෂ 10 ක් ඉක්ම ගොස් ඇතත් අරමුදලේ රීති සකස් කර නොතිබුණි. පළාත් සභාව විසුරුවා හැර ඇති අවස්ථාවකදී අමාත්‍යවරුන්ගේ බලතල ආණ්ඩුකාරවරයාට පැවරෙන නමුත් ආණ්ඩුකාරවරයා විසින් ද එකී රීති සකස් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු ගණුදෙනුවක් සිදු කර නොතිබුණි. | ආණ්ඩුකාරවරයාට යොමුකර ඇත. | අරමුදල සඳහා රීති සකස් කළ යුතු වේ. |

**1.5.15 ශීර්ෂය 660 – උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ----------------------- | -------------- |

| | | | |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන ආදායම් සංකේත 09 ක් වූ අතර ඒවාට අදාළ නිරීක්ෂණයන් පහත දැක්වේ. | | |
| (i) | ආදායම් සංකේත 02 කට අදාළව ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.110,000,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.146,972,812 ක් විය. ඒ අනුව එකී ආදායම් සංකේත 02 ට අදාළව පිළියෙලකර තිබුණු ඌන ඇස්තමේන්තු වටිනාකම රු.36,972,812 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 34 ක් විය. | පිළිගෙන ඇත. | ඇස්තමේන්තු ආදායම, තථ්‍ය ආදායමට ආසන්න විය යුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 06 කට අදාළව ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.939,250,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.692,373,238 ක් විය. ඒ අනුව එකී ආදායම් සංකේත 06 ට අදාළව පිළියෙලකර තිබුණු අධි ඇස්තමේන්තු වටිනාකම රු.246,876,762 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 26 ක් විය. | පිළිගෙන ඇත. | ඇස්තමේන්තු ආදායම, තථ්‍ය ආදායමට ආසන්න විය යුතු වේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 1002.12.00 යටතේ වූ ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙලකර නොතිබුණු නමුත් වර්ෂයේ තථ්‍ය ආදායම රු.9,521,752 ක් වී තිබුණි. | පිළිගෙන ඇත. | සියළු ආදායම් සඳහා ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. |

**1.5.16 ශීර්ෂය 661 – උතුරු මැද පළාත් භාණ්ඩාගාරය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ------------------------ | --------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ උතුරු මැද පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල සටහන 10 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.543,403,854 ක් වූ අතර ඉන් වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවූ ශේෂයන්ගේ එකතුව රු.43,375,481 ක් විය. | හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.3,180,031 ක් නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.6,330 ක් සහ තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ | වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවූ තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | රු.9,810 ක් නිරවුල් කිරීමට කටයුතුකර ඇති බව දක්වා ඇත. | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන 10 අනුව තැන්පත් ගිණුම් යටතේ පළාත් භාණ්ඩාගාරයට අදාළව දක්වා ඇති රු.62,809,930 ක ශේෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අදාළ රු.62,191,229 ක් වූ තැන්පතු ශේෂයක් ද ඇතුළත්ව තිබුණි. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළ රු.29,303,471 ක තැන්පතු ශේෂයන් වර්ෂ 02 ට වඩා වැඩි කාලයක් ඉක්මවා තිබුණි. | ප්‍රධාන අමාත්‍යාංශයේ රු.129,791,453 ක තැන්පතු සහ ප්‍රධාන ලේකම් කාර්යාලයේ රු.13,358,410 ක තැන්පතු වැඩ අවසන් නොවූ කොන්ත්‍රාත්වලට අදාල රඳවා ගැනීමේ මුදල් වන අතර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාල රු.269,341 ක මුදල සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාල රු.788,031 ක මුදල රජයේ ආදායමට ගෙන ඇති බව දක්වා ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට අදාළ වර්ෂ 02 ට වඩා වැඩි කාලයක් ඉක්මවා ඇති තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු, විදේශ ව්‍යාපෘති, ජාතික අයවැය දෙපාර්තමේන්තුව යනාදී මූලාශ්‍ර වලින් උතුරු මැද පළාත් සභාව වෙත රු.1,595,033,325 ක් වූ අග්‍රිමයක් ලැබී තිබුණු නමුත් මූලාශ්‍ර 07 කින් ලැබී ඇති රු.422,111,609 ක් වූ අග්‍රිම ඉතිරිවී තිබුණු අතර එකී ඉතිරිය ලැබී තිබුණු මුළු අග්‍රිමයෙන් සියයට 06 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය. | අග්‍රිම ලබාදෙන ආයතන විසින්ම ඒවා සැලසුම්කරන අතර ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් පළාත් සභාව වෙත මුදල් නිදහස් කරයි. ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා පමණක් ගෙවීම් කර ඇති බව දක්වා ඇත. | ලැබෙන සියළු අග්‍රිමයන් උපයෝජනය කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී දේශගුණ සුහුරු ව්‍යාපෘතිය, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP), සෞභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන සහ වාරි සෞභාග්‍යා යන ව්‍යාපෘති 04 ට අදාළව ඇස්තමේන්තු කළ මුදල රු.1,525,549,163 ක් වූ නමුත් ක්‍රියාත්මක කිරීමේ දුර්වල ප්‍රගතිය හේතුවෙන් වර්ෂය තුළදී ලැබී ඇති මුළු මුදල රු.278,100,287 ක් විය. එය | අදාළ ව්‍යාපෘතිවල ඉල්ලීම අනුව රු.1,525,549,163 ක් වූ පරිපූරක ප්‍රතිපාදන අනුමත කර ඇතත් ව්‍යාපෘති ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය අනුව ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය විසින් ලබා | ඇස්තමේන්තු කළ පරිදි සියළු අග්‍රිමයන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රගතියක් අත්පත් කර ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු කළ මුදලින් සියයට 18 ක් විය. | දී ඇති මුදල රු.278,100,287 ක් බව දක්වා ඇත. | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී මධ්‍යම රජයේ අමාත්‍යාංශ 02 කින් ලැබී තිබුණු රු.273,756,124 ක් වූ අග්‍රිමයෙන් දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ රු.66,192,651 ක් ආපසු යවා තිබුණි. ආපසු යවා ඇති මුදල ලැබී තිබුණු අග්‍රිමයෙන් සියයට 24 ක් වී තිබුණි. | අග්‍රිම ලබාදෙන ආයතන විසින්ම ඒවා සැලසුම්කර ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් පළාත් සභාව වෙත මුදල් නිදහස් කරන අතර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා පමණක් ගෙවීම් කර ඇති බව දක්වා ඇත. | ලැබෙන සියළු අග්‍රිමයන් උපයෝජනය කළයුතු වේ. |
| (ඊ) | උතුරු මැද පළාත් හදිසි අවස්ථා අරමුදල<br>-----------------------------------------------<br>උතුරු මැද පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් 1989 අංක 02 දරන හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තියේ 02(1) වගන්තිය ප්‍රකාරව හදිසි අවස්ථා අරමුදල පිහිටුවා ඇති නමුත් අරමුදල පිහිට වූ දිනයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී උතුරු මැද පළාතේ ඇති වූ හදිසි අවස්ථාවන් සඳහා මෙම අරමුදලින් අත්තිකරම් ලබා දී නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.30,131,572 ක් ව පැවති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | අරමුදලේ සීමාව ඉක්මවා මුදල් රැස් කිරීමට බලයක් නැති බැවින් සීමාව ඉක්මවා මුදල් රැස් කිරීම නොකල යුතු වේ. |

**1.5.17 ශීර්ෂය 662 – උතුරු මැද පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි රු.27,660,000 ක මූල්‍ය දායකත්වයෙන් උතුරු මැද පළාත සඳහා 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට දස | | |

| | | |
|---|---|---|
| අවුරුදු තිරසර ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම වෙනුවෙන් රු.27,606,176 ක මුදලක් වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය. | | |
| (i) තිරසර ඒකාබද්ධ සංවර්ධ සැලැස්ම පිළියෙල කිරීමේදී උතුරු මැද පළාතේ ආර්ථික, සාමාජීක හා පාරිසරික සංවර්ධනයේදී සහයෝගයෙන් කටයුතු කිරීමට උතුරු මැද පළාතේ ප්‍රධාන ලේකම්වරයා සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණු නමුත් එකී ගිවිසුමට පටහැනිව විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ ගිවිසුම් ගතවී ඔවුන්ගේ සේවය සහ විශ්වවිද්‍යාලයේ භෞතික සම්පත් යොදා ගැනීම වෙනුවෙන් එම ආචාර්යවරුන් වෙත ගෙවීම් සිදුකර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අවබෝධතා ගිවිසුමට අනුකූලව කටයුතු සිදුකළ යුතු වේ. |
| (ii) තිරසර ඒකාබද්ධ සංවර්ධ සැලැස්ම පිළියෙල කිරීමේ දී ප්‍රධාන වශයෙන් උපයෝගී කරගෙන ඇති දත්ත ලබාගෙන තිබුණු, උතුරු මැද පළාත් සභාව විසින්ම පිළියෙල කළ "ගම" නැමැති ග්‍රන්ථය පිළියෙල කිරීමේ අරමුණු, එය පිළියෙල කිරීමට සම්බන්ධ වූ පුද්ගලයින් සහ ඒ සඳහා වැය වූ මුදල සම්බන්ධයෙන් තොරතුරු සැපයීමට උතුරුමැද පළාත් සභාව අපොහොසත් විය. | පිළිතුරු ලබා දී නැත. | ග්‍රන්ථය පිළියෙල කිරීමේ අරමුණු, එය පිළියෙල කිරීමට සම්බන්ධ වූ පුද්ගලයින් සහ ඒ සඳහා වැය වූ මුදල සම්බන්ධයෙන් තොරතුරු සැපයිය යුතු වේ. |
| (iii) 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු දස අවුරුදු තිරසර ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම වෙනුවෙන් රු.27,606,176 ක මුදලක් වැයකර ඇතත් 2022 ඔක්තෝබර් 17 දින වන විටත් එකී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | තිරසර ඒකාබද්ධ සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට මෙම සැලැස්ම පිළියෙළ කළ යුතු වේ. |

**1.5.18 ශීර්ෂය 663 – උතුරු මැද පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ----------------------- | -------------- |

උතුරු මැද පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන අත්තිකාරම් ගිණුම

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ තත්ත්ව පාලන අත්තිකාරම් කටයුත්තට අදාළ කිසිදු ගනුදෙනුවක් අභ්‍යන්තර විගණනයට ලක් කර නොතිබූ අතර, පසුගිය වර්ෂයේද අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පිළිගෙන ඇත. | අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාල ගනුදෙනු අභ්‍යන්තර විගණනයට ලක් කළයුතු වේ. |

**1.5.19 ශීර්ෂය 665 – උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා III හෝ II ශ්‍රේණියේ ආදායම් තක්සේරුකරු/ ජ්‍යෙෂ්ඨ ආදායම් තක්සේරුකරු තනතුරු 11 ක් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමතකර තිබුණු නමුත් 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් ආදායම් සේවයේ නිලධාරීන් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ ආදායම් තක්සේරුකරු/ජ්‍යෙෂ්ඨ ආදායම් තක්සේරුකරු තනතුරුවල ශ්‍රේණිය II හෝ I වශයෙන් දක්වා තිබුණි. එම වැරදි බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය පදනම් කරගෙන ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් 04 දෙනෙකු I ශ්‍රේණියට උසස් කර තිබුණු අතර එකී නිලධාරීන් වෙත රු.2,639,652 ක මුදලක් වැටුප් හා දීමනා සහ දිරි දීමනා වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව කටයුතු කර ඇති බව දක්වා ඇත. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමතකර ඇති තනතුරු නාම සහ ශ්‍රේණි පමණක් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට ඇතුළත් කළයුතු වේ. |
| (ආ) | උතුරු මැද පළාත් ආදායම් කොමසාරිස්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන ආදායම් සංකේත 06 කට අදාළව ඇස්තමේන්තුකර තිබුණු ආදායම රු.87,500,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.61,662,545 ක් විය. ඒ අනුව අධි ඇස්තමේන්තු වටිනාකම රු.25,837,455 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 30 ක් වී තිබුණි. | පිළිගෙන ඇත. | හැකිතාක් තාත්වික සහ නිවැරදි ලෙස තම ඇස්තමේන්තු පිළියෙල කිරීමට ආදායම් ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළයුතු වේ. |

**1.5.20 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්මික නිලධාරී සහ කළමනාකරණ සහකාර තනතුරු සඳහා 2005 සහ 2011 වර්ෂවලදී බඳවාගෙන තිබුණු නිලධාරීන් දෙදෙනෙකු විසින් බඳවා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කළ අධ්‍යාපන සහතික ව්‍යාජ ඒවා බව තහවුරු වී තිබියදීත් එම වරද සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට වැටුප් හා දීමනා ලෙස බඳවාගත් දිනයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා එකී නිලධාරීන් දෙදෙනා වෙත එකතුව රු.12,050,063 ක් ගෙවා ඔවුන් තවදුරටත් සේවයේ යොදවා ගනිමින් සිටී. | පිළිගනිමි. | බඳවා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කළ අධ්‍යාපන සහතික ව්‍යාජ ඒවා බව තහවුරු වීමෙන් පසු අදාල නිලධාරීන් සේවයෙන් ඉවත්කළයුතු වේ. |
| (ආ) | උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර තනතුරකට 2004 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බඳවා ගෙන තිබුණු නිලධාරියෙකු එදින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල විවිධ අමාත්‍යාංශවලට අනුයුක්ත කර තිබුණු අතර වැටුප් හා දීමනා ලෙස අධිකාරිය විසින් ඔහුට ගෙවා තිබුණු රු.8,216,229 ක් වූ මුදල එකී නිලධාරියා අනුයුක්තව සේවය කළ අමාත්‍යාංශවලින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා ගෙවනු ලබන මාර්ග සංවර්ධන අධිකාරී දීමනාව ලෙස රු.1,001,012 ක් ද අධිකාරියෙන් පිටත සේවය කළ කාලය සඳහා එකී නිලධාරියාට ගෙවා තිබුණි. එම දීමනාවට අදාළව සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට රු.150,151 ක මුදලක්ද ගෙවා තිබුණි. | පිළිගනිමි. | අධිකාරියේ සේවයට බඳවා ගන්නා නිලධාරීන් අධිකාරියේ සේවයේ යෙදවිය යුතුවීම සහ වෙනත් ආයතනයකට අනුයුක්ත කරන්නේ නම් එකී ආයතනයෙන් නිලධාරියාට අදාල වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. |
| (ඇ) | 2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා | පිළිගෙන ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව |

| | | | |
|---|---|---|---|
| | වක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් වැලකිය යුතු අතර එම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීමේ වගකීම ප්‍රධාන ලේකම්වරයා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, ආයතන ප්‍රධානියා සහ මූල්‍ය අංශයේ ප්‍රධානියා විසින් දැරිය යුතුවේ. එසේ වුවත් එකී උපදෙස්වලට පටහැනිව උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් ශිල්පි, දත්ත සැකසුම්කරු, කම්කරු පාලක, යන තනතුරු 03 සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයේදී නිලධාරීන් 06 දෙනෙකු බඳවාගෙන තිබුණි. එකී නිලධාරීන් 06 දෙනා වෙත වැටුප් හා දීමනා ලෙස බඳවාගත් දිනයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා එකතුව රු.18,356,162 ක් ගෙවා තිබුණි. | | අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය බඳවා නොගතයුතු වේ. |
| (ඇ) | කල් ඉකුත් වූ රු.2,114,525 ක් වූ කොන්ත්‍රාත් රැඳවුම් තැන්පතු සහ ටෙන්ඩර් තැන්පතු 22 ක් සම්බන්ධයෙන් මු.රෙ. 570 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ඉ) | 2019 වර්ෂයේදී අවසන් වී ඇති පිබිදෙමු පොලොන්නරුව වැඩසටහනට අධිකාරිය විසින් 2019 වර්ෂයේදී සපයන ලද උපදේශණාත්මක සේවා වෙනුවෙන් ලැබිය යුතු රු.35,944,342 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් අය කරගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇත. | ලැබිය යුතු ආදායම් නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඊ) | අධිකාරියේ සේවයෙන් ඉවත් ව ගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකු වෙනුවෙන් පෙර වර්ෂවලදී | පිළිගෙන ඇත. | සේවයෙන් ඉවත් වී ඇති නිලධාරීන්ගේ පාරිතෝෂික මුදල් නියමිත පරිදි නිරවුල් |

| | | | |
|---|---|---|---|
| | වෙන්කර තිබුණු එකතුව රු.1,226,803 ක් වූ පාරිතෝෂික වෙන් කිරීම් සමාලෝචිත වර්ෂයේදී ද නිලධාරීන්ට නොගෙවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි. | | කළයුතු වේ. |

**1.5.21 උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | ------------- |
| (අ) | උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියට අයත් කැකිරාව බස් නැවතුම්පලේ කඩ කාමර 12 ක් 2002 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ නව තක්සේරු කිරීම් හෝ බදු සංශෝධනය කිරීමකින් තොරව වරින් වර රු.2,000 ක මාසික කුලියට ව්‍යාපාරිකයින්ට බදු දී තිබුණි. එසේම කැකිරාව ප්‍රාදේශීය සභාව සතු එකී කඩ කාමර පිහිටි ඉඩමේ අයිතිය, අධිකාරිය වෙත පවරා ගැනීමට 2021 වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | පිළිගෙන ඇත. | වටිනාකම තක්සේරුකර බදු කුලී සංශෝධනය කළයුතු වේ. |
| (ආ) | කැකිරාව බස් නැවතුම්පලේ පිහිටි කඩ කාමර 65 ක් වෙනුවෙන් 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.3,523,009 ක කුලී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණු අතර මුල් බදුකරු විසින් කඩ කාමර 06 ක්, වෙනත් පුද්ගලයින් වෙත විකිණීම හෝ අතුරු බදු දීම සිදුකර ඇතත් කඩ කාමර කුලියට දීමේදී ගිවිසුම් අත්සන් කර නොතිබීම හේතුවෙන් විකිණීම හෝ අතුරු බදු දීම සිදුකළ තැනැත්තන්ට එරෙහිව කිසිඳු නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | පිළිගෙන ඇත. | ලැබිය යුතු කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | අධිකාරිය විසින් බස් නැවතුම්පලවල් 14 ක විවිධ ඉදිකිරීම් සිදුකර ඒවා නඩත්තු | මෙම ඉඩම් පළාත් පාලන ආයතන සතු බැවින් ඔවුන්ගේ එකඟතාවය | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | කරනු ලැබුවත් එම ඉඩම්වල අයිතිය කැකිරාව ප්‍රාදේශීය සභාවෙන් අධිකාරිය වෙත පවරා ගැනීමට 2021 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ලබාගැනීමට කටයුතු කළ නමුත් එකී එකඟතාවය නොලැබුණු බව දක්වා ඇත. | |
| (ඈ) | 2013 අංක 03 දරන මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ප්‍රඥප්තියේ 6(2) I අනුව අධිකාරිය විසින් ත්‍රිරෝද රථ සේවා සම්බන්ධයෙන් ඉටු කළ යුතු ත්‍රී රෝද රථ ලියාපදිංචිය, රියදුරන් ලියාපදිංචිය හා අවසර පත් නිකුත් කිරීම යනාදී ප්‍රධාන කාර්යයන් 13 ඉටුකර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දක්වා ඇත. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**1.5.25 උතුරුමැද පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------------- | ------------- |
| (අ) | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය විසින් අධීක්ෂණය කරනු ලබන පෙර පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන්ට 2014 ඔක්තෝබර් මාසයට අදාළව ගෙවිය යුතුව තිබුණු රු.900,000 ක් වූ ගුරු දීමනා සහ අධිකාරිය සතුව පැවතුණු රු.286,408 ක් වටිනා පරිගණක, ශබ්ද විකාශන යන්ත්‍ර හා අනෙකුත් උපකරණ, 2013 නොවැම්බර් 14 දින සිට 2015 මාර්තු 14 දින දක්වා කාලපරිච්ඡේදයේ දී අධිකාරියේ සේවය කළ කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් වංචා සහගත ලෙස රැගෙන ගොස් තිබුණු නමුත් ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම 2022 වර්ෂය දක්වා ප්‍රමාද කර තිබුණි. | නඩු පවරා ඇති බව දක්වා ඇත. | නිත්‍යානුකූලව කටයුතු කිරීමට ප්‍රමාදවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කළ යුතු අතර නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර වැරදිකරුවන්ට දඬුවම් දියයුතු වේ. |
| (ආ) | නියමිත කාලයේදී සේවා | අධිභාරය වගකිව යුතු | අධිභාරය වගකිව යුතු |

| | | | |
|---|---|---|---|
| | නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.412,749 ක අධිභාර පනවා තිබුණු නමුත් එය මුලාා ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සහ ගෙවීම් කිරීමටත්, ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | නිළධාරීන්ගෙන් අයකර ගතයුතු වේ. |
| (ඇ) | උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අරමුදලේ රු. 5,967,434 ක මුදලක් දීර්ඝ කාලයක සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනකර තිබුණු අතර එකී මුදල උපයෝගී කරගෙන එම අරමුදල පිහිටුවීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරන බව දක්වා ඇත. | අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළයුතු වේ. |

### 1.5.26 උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------------- | ------------- |
| (අ) | 2015 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව රජයේ ආයතනවලින් අයවිය යුතුව පවතින මුද්‍රණාල ආදායම් රු.7,189,412 ක්, යන්ත්‍ර කුලී ආදායම් රු.5,784,063 ක්, ආරක්ෂක අංශයේ ආදායම් රු.6,277,612 ක්,වාහන අලුත්වැඩියා අංශයේ ආදායම් රු.10,314,119 ක්, වාහන සේවා කිරීමේ ආදායම් රු.3,664,700 ක් සහ ටයර් සේවා මධ්‍යස්ථානයේ ආදායම් රු.1,793,973 ක් අය නොවී පැවති අතර ඉන් පිළිවෙළින් සියයට 87 ක් වූ රු.6,228,275 ක්, සියයට 21 ක් වූ රු.1,190,485ක් , සියයට 56 ක් වූ රු.3,488,463 ක්, සියයට 15 ක් වූ රු.1,542,071 ක්, සියයට 17 ක් වූ | පිළිගෙන ඇත. | සියළු ආදායම් නියමිත කාලය තුලදී අයකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.605,162 ක් සහ සියයට 37 ක් වූ රු.671,005 ක් අය නොවී පැවතුණු කාලය වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා පරාසයක විය. | | |
| (ආ) | වර්ෂ 13 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින එකතුව රු.16,011,120 ක එකතු කළ අගය මත බදු සහ රු.8,966,846 ක භාණ්ඩ හා සේවා මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාකර නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව දක්වා ඇත. | සියළු බදු නියමිත කාලය තුලදී ගෙවිය යුතු වේ. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව එකතුව රු.9,506,813 ක් වූ ගෙවිය යුතු මුද්‍රණාල වියදම්, ටයර් සේවා මධ්‍යස්ථාන වියදම් සහ ගෙවිය යුතු අමතර කොටස් වියදම් පැවතුණු අතර ඉන් එකතුව රු.5,258,106 ක් නොපියවා තිබුණු කාලය වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා පරාසයක විය. | කඩිනමින් පියවීමට කටයුතු කරන බව දක්වා ඇත. | සියළු ගෙවිය යුතු වියදම් පියවීම කළයුතු වේ. |

1.5.27 උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------------- | ------------- |
| (අ) | ණය ගෙවීම පැහැර හරින පුද්ගලයින්ට එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග ණය ගිවිසුමේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කළ රු.20,563,940 ක් වූ ව්‍යවසායකත්ව ණය වලින් වර්ෂ | අයකර ගැනීමට හැකි ණය අයකර ගැනීමටත් ඉතිරි ණය කපා හැරීමටත් කටයුතු කරන බව දක්වා ඇත. | සියළු ණය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

05 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු.2,755,237 ක් වූ ණය ශේෂයන් 45 කට අදාළව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

1.5.28 උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දීර්ඝ කාලයක සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනකර තිබුණු රු.2,000,000 ක මුදල උපයෝගි කරගෙන උතුරු මැද පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමෙන් ළගා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගෙන ඇත. | පළාත් පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමෙන් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට පියවර ගතයුතු වේ. |